# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2317/56 - 2023 පෙබරවාරි මස 01 වැනි බදාදා - 2023.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2023

2023 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු 2023 පෙබරවාරි මස 01 වන දින ආරම්භ කර ඇති බව 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. දැනට වලංගුව පවතින 2022 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය, 2022(1), 2022(2) සහ 2022(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන (මින් ඉදිරියට වලංගු ඡන්දහිමි නාමලේඛනය ලෙස හඳුන්වනු ලබන) හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් ස්වකීය කාර්යාලවල දී සහ පහත දැක්වෙන කාර්යාලවලදී ප්‍රදර්ශනය කරනු ඇත.

| *නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල* | *ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්* |
|---|---|
| එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මැතිවරණ කොට්ඨාසයට/ පරිපාලන දිස්ත්‍රික්කයට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත |
| එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි වලංගු ඡන්දහිමි නාමලේඛන කොටස |

03. මේ අනුව යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියෙකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තෙකුටම සිය නම ඉහත ස්ථානවල ප්‍රදර්ශනය වන ඡන්දහිමි නාමලේඛන පරීක්ෂා කර බලා නිසැක විය හැකිය. ඊට අමතරව www.elections.gov.lk මැතිවරණ කොමිෂන් සභාවෙහි වෙබ් අඩවියට පිවිස පරීක්ෂා කළ හැක.

04. 2023 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය පහත සඳහන් අයුරින් සිදුකිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව මහජනතාව වෙත දැනුම් දෙනු ලැබේ.


1A - G 38746 — 21 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. දැනට වලංගුව පවතින 2022.10.31 දින සහතික කරන ලද 2022 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය; 2022.11.08 දින සහතික කරන ලද 2022(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය; 2022.11.15 දින සහතික කරන ලද 2022(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහ 2023.02.01 දින සහතික කරන ලද 2022(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ඒකාබද්ධ කර 2023 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ඒකාබද්ධ ලැයිස්තු සකස් කරනු ලැබේ.

06. එක් එක් වසමෙහි ග්‍රාම නිලධාරී එම වසමෙහි ඡන්දහිමියන් ගණන් ගැනීමේ නිලධාරී ලෙස කටයුතු කරනු ලැබේ. අවස්ථාවෝචිතව විශේෂ ගණන් ගැනීමේ නිලධාරීන්ද යෙදවිය හැක.

07. ගණන් ගැනීමේ නිලධාරී සෑම ගෘහයකටම පැමිණෙන අතර ඔහු විසින් රැගෙන එන ඒකාබද්ධ ඡන්දහිමි ලැයිස්තුවෙහි පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර ගෘහ මූලික අත්සන් තැබිය යුතුය.

08. කිසියම් ඡන්දහිමියෙකු 2022 වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇත්නම් 2023 වර්ෂය සඳහාද 2022 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව තිබූ ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ඇත. ඒ සඳහා ගෘහමූලික විසින් ඒකාබද්ධ ලැයිස්තුවෙහි අත්සන් තැබීම හැර වෙනත් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවද සලකන්න. කිසියම් තැනැත්තෙකු 2022 වර්ෂයේ ලියාපදිංචි වී නැත්නම් හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ප්‍රථම වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වන්නේ නම් හෝ 2022 වර්ෂයේ ලියාපදිංචි ලිපිනය වෙනස් කළ යුතු වන්නේ නම් හෝ 2023 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා 2023/ER ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ගණන් ගැනීමේ නිලධාරී වෙත භාර දෙන්න. වැඩිදුර විස්තර 2023/ER ආකෘතියෙහිම සඳහන්ව ඇත.

09. 2022 වර්ෂයේ ලියාපදිංචි වී ඇති ඡන්දහිමියෙකු මිය යෑම හෝ පදිංචිය වෙනස්වීම හෝ වෙනත් හේතුවක් නිසා 2023 වර්ෂයේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන විටදී ඒ බවද ඔබගේ ගණන් ගැනීමේ නිලධාරී වෙත දැනුම්වත් කරන්න.

10. 2023.02.01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන; එනම් 2005.01.31 දින හෝ ඊට පෙර උපත ලැබූ තැනැත්තන් 2023 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

11. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව 'අ' 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය , හිමිකම් හා විරෝධතා භාරගැනීම පිළිබඳව දැන්වීම් අවස්ථාවෝචිතව ඉදිරියේදී ප්‍රසිද්ධ කරනු ලැබේ.

12. ඉදිරියේදී සහතික කිරීමට නියමිත පහත සඳහන් පරිපූරක ඡන්දහිමි නාමලේඛන 06ක් සඳහා YC ආකෘති මගින් තොරතුරු එක්රැස් කිරීම සිදුකෙරේ. පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා භාරගැනීම පිළිබඳව ඉදිරියේදී ප්‍රසිද්ධ නිවේදන මගින් දැනුම් දෙනු ලැබේ.

12.1. 2023 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාම ලේඛනය:

| *පරිපූරක ඡන්දහිමි නාමලේඛනය* | *අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය* | *උපන් දිනය* |
|---|---|---|
| 2023(1) | 2023.02.01 සිට 2023.05.31 දක්වා | 2005.02.01 සිට 2005.05.31 දක්වා |
| 2023(2) | 2023.06.01 සිට 2023.09.30 දක්වා | 2005.06.01 සිට 2005.09.30 දක්වා |
| 2023(3) | 2023.10.01 සිට 2024.01.31 දක්වා | 2005.10.01 සිට 2006.01.31 දක්වා |

12.2. 2024 වර්ෂය සඳහා සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාම ලේඛනය:

| *පරිපූරක ඡන්දහිමි නාමලේඛනය* | *අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය* | *උපන් දිනය* |
|---|---|---|
| 2024(1) | 2024.02.01 සිට 2024.05.31 දක්වා | 2006.02.01 සිට 2006.05.31 දක්වා |
| 2024(2) | 2024.06.01 සිට 2024.09.30 දක්වා | 2006.06.01 සිට 2006.09.30 දක්වා |
| 2024(3) | 2024.10.01 සිට 2025.01.31 දක්වා | 2006.10.01 සිට 2007.01.31 දක්වා |

13. ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගැනීමේ නිලධාරීන් ගෘහයෙන් ගෘහයට යෑම 2023.02.15 දිනෙන් පසුව සිදු කරන බව දැනුම් දෙනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 01 වැනි දින,
සරණ මාවත, රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0365

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.